# නරි උපාය



තුෂාරී දේවසූරේන්ද්‍ර



# නරී උපාය

© තුෂාරි දේවසුරේන්ද්‍ර
කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය : 2023 දෙසැම්බර්

ISBN 9978-624-206-774-2

කර්තෘ : තුෂාරි දේවසුරේන්ද්‍ර

පරිගණක අක්ෂර සහ
ග්‍රැෆික් නිර්මාණයකරණය : අචනි රණසිංහ - නෙත්වින් ප්‍රින්ටර්ස්
මුද්‍රණය : ''දළඳා සෙවණේ අපි පදනම''
ගැටඹේ හන්දිය, මහනුවර
081 2 386 908

# පිදුම

සැමදා සෙවනැල්ලක් මෙන් මා පසුපස සිටිනා මාගේ

ආදර දෙමව්පියන්ට

හා

දැනුමෙන්.අධ්‍යාපනයෙන් පමණක් නොව ජීවිත අවබෝධය

ලබා දී මා නිරතුරුව දැනුවත් කල මාගේ ආදර ඇදුරුතුමන්

වන

සෙනෙවිරත්න මහලේකම්

වෙත ආදරයෙනි.

# ස්තුතිය

කතන්දර පොත ලිවීමට මා උනන්දු කළ මාගේ ආදර අම්මා සහ අලංකාර චිත්‍ර ඇඳ දුන් නෙතිනි සෙයාරා කල්පගේ දියණියට මාගේ හදපිරි තුතිමල් පුද දෙමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023.11.01

කැලයක හිටියා කකුලේ
ලොකු ගෙඩියක් තිබුණු
නරිහාමි කෙනෙක්.





ඉතින් මේ නරිහාමි ගියා
ගමේ ඉන්න වෙදරාළ
හම්බවෙන්න.


මට පුළුවනි වෙදකම් කරන්න නරිහාමි. මට හොඳ මුට්ටියකුයි සුදු රෙදි කඩකුයි ගෙනත් දෙන්නකෝ.
හා හොඳයි වෙදරාළේ ගෙනත් දෙන්නම්.



ඔන්න ඉතින් නරිහාමි
මුට්ටියකුයි සුදු රෙදි
කඩකුයි අරගෙන වෙදරාළ
ළගට ගියා.



දැන් ඉතින් බය වෙන්න දෙයක් නැහැ. නරිහාමි ගෙඩියේ තියෙන සැරව ටික අයින් කරලා මම මුට්ටියට දැම්මා. තුවාලෙටත් බෙහෙත් දැම්මා. ඉක්මනට සනීප වෙයි.

පින් අයිති වෙනවා වෙදරාළ මගේ මේ ගෙඩිය හොඳ කළාට.



ඔන්න දැන් නරිහාමි සැරව
මුට්ටිය ඔලුව උඩින් තියාගෙන
ගමදිගේ ඇවිද ගෙන ගියා.



ඩුං ඩුං ඩුං බෙරකාරයෙක්
එනවා පාර දිගේ ඉස්සරහට.



ආ.........මේ නරිහාමි නේද?
උදෑසනම බැහැරක් වගේ.
ඔව් මම මේ ගමට ආවා.

අලුත් පැණි මුට්ටියක් වගේ
නේද ? නරිහාමි.

ඔව් ඔව් මේ හොඳ අලුත්
කිතුල් පැණි.



මට ආසයි අලුත් පැණි
කන්න. නරිහාමි පැණි මුට්ටිය
මට දෙන්න බැරිද?

හ්ම් පුළුවනි. මට මොනාද
දෙන්නේ ?

මම මේ බෙරය දෙන්නම්,
මේක විකුණන්න
ගෙනියන්නේ.

හොඳයි එහෙනම්.



ඩුං ඩුං ඩුං................

සැරව දීලා බෙර ගත්තා.
ඩුං ඩුං ඩුං ඩුං....................

කිය කියා නරිහාමි
සතුටින් කැලයට ගියා.

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01

978- 624- 206- 774- 2